ශ්‍රී ලංකාව යළිත් බෞද්ධ රාජ්‍යයක් වේවා!

කරුණාකර තුන් සූත්‍රය සජ්ඣායනා කොට
ශාසනාරක්ෂක මහේශාක්‍ය දේවසමූහයාට පින් දී,
මේ කවි උදේ සවස ශබ්ද නගා
කියවනු මැනවි.

ශ්‍රී ලංකාව යළිත් බෞද්ධ රජයක් වේවා!

සඟ සිරි වරෙක මේ ලෙසය ගෙන ඇර පෑවා–
වගෙ සිරි සැපෙනි බඳ වැඩි වැඩී බැබ ලේවා
නර සැරි දම් එළිය නෙදියන පැනි රේවා
මෙමසිරි ලක යළිත් බෞද්ධ රජයක් වේවා!

සාදු සාදු සාදු

පැර කුම් ගැමුණු වැනි කළ තිලකාව සේවා
නර පති කමට තිසි අය සුපහල වේවා
පර සතුරෙකුට කප් හිමි නොවහල් වේවා
වර සිරිලක යළිත් බෞද්ධ රජයක් වේවා!

සාදු සාදු සාදු

මගෙ මව් බිමට ඔබෙ මගෙ සේවය වේවා
මගෙ දැය සමය හිරු සඳු මෙන් බැබළේවා
මගෙ ඔබෙ බේදයක් අවුලක් නොම වේවා
මගෙ සිරිලංකා යළිත් බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

මගෙ වැයම ද රට දැය රැකුමෙහි වේවා
මගෙ ජීවිතය එහිදැසී බැතිය ද වේවා
මගෙ රට දැය ලොවට වැඩ පිණිසම වේවා
මගෙ සිරිලංකා යළිත් බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

මගෙ රට දැයම මගෙ ජීවිතය ද — වේවා
මගෙ සඟරුවන තිති මගෙ පින් කෙත — වේවා
මගෙ බුදු දහම රිවිකිරණසෙ පැති — රේවා
මගෙ සිරිලක යළිත් බොදු රජයක් — වේවා!

සාධු සාධු සාධු

තුරු ලිය මල් මලින් මල තුනී ගී — ගාවා
නව වසරකට සැරසෙන සිරියක් — පෑවා
යටගිය අතීතය සමරන්නට — පාවා
යළි සිරි ලංකාව බොදු රජයක් — වේවා!

සාධු සාධු සාධු

සිරි පැරකුම් ගැමුණු නරවරයන් ගාවා
සිරිලක නිතර සදහම් එළියෙන් නැවා
නැවතත් සැනසෙන්ට එ දහම් රස ගාවා
යළි සිරි ලංකාව බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

ඉ පැරණි දඹුළු සීගිරි සිතුවම් සේවා
සෙන්කඩගල නුවර අනුරාපුර මේවා
ජාතික වස්තු ලෙස රැකගන්නට පාවා
යළි සිරි ලංකාව බෞද්ධ රජයක් වේවා!

සාධු සාධු සාධු

ලොතරැසි රේස් සුදුව-රා සැල් සේවා
'ශංඛාංක් වෙිල් පංචි' සිතමා තාටක මේවා
වලලා ලන්ට සදහට මළවුන් ගෑවා
යළි සිරි ලංකාව බොදු රජයක් වේවා!

සාදු සාදු සාදු

ගව ඝාතක නීති සොර අල්ලස් සේවා
මැරවර සුරා දුසිරිත් මුල්ලක බාවා
අසරණ සතුන් මරණින් මුදනට පාවා
යළි සිරි ලංකාව බොදු රජයක් වේවා!

සාදු සාදු සාදු

මිහිකත අමාරස දම් දියරින් නාවා
මිසදිටු අඳුරු බිඳ ආලෝකය ගාවා
මුළු ලෝකයට සාමය දෙන්නට පාවා
ශලි සිරි ලංකාව බොදු රජයක් වේවා!

සාධු සාධු සාධු

නැවතත් පෙරදි මෙන් මේ රට සරු වේවා
සාමය සමාදානය ඉන් මතු වේවා
පාලක පිරිස දැහැමිම උදවිය වේවා
මෙම සිරිලක ශලින් බොදු රජයක් වේවා!

සාධු සාධු සාධු

(2495 සමස්ත ලංකා වෙසක් කාව්‍ය තරඟයෙන් උපුටා ගන්නා ලදී)

බුද්ධ ශාසනය බැබලේවා! සත්‍ය ධර්මය පැතිරේවා!!

ලෝක සාමය ඇතිවේවා!!!

“දෙවෝ වස්සතු කාලෙන - සස්සසම්පත්ති හෙතුච

පීතො භවතු ලොකොච - රාජ භවතු ධම්මිකො”!

සිංහල බෞද්ධයෝ අවදිවෙත්වා!

ජයමංගල ගාථාව

සළික් ශ්‍රී ලංකාවේ ජාතික ගීය වේවා!!

"බාහුං සහස්ස මභිනිම්මිත සායුධන්තං
ගිරිමේඛලං උදිතඝෝර සසේන මාරං
දානාදි ධම්ම විධිනා ජිතවා මුනින්දෝ
තං තේජසා භවතු තේ ජයමංගලානි"

(3)